සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

60 S I, II

90965

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

2019.12.12 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

**සැලකිය යුතුයි:**
(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගොවිපළෙහි වැඩ කරමින් සිටින අතරතුර ඇති වූ පිපාසය සංසිඳුවා ගැනීමට, විවිධ සේවා සමුපකාර සමිතිය මගින් පවත්වාගෙන යනු ලබන 'මිහිරි රසහල' වෙත ගිය කමලා පලතුරු බඳුනක් ද විමලා කිරි වීදුරුවක් ද මිල දී ගන්නා ලදී.

**1.** 'මිහිරි රසහල' විසින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව කුමක් ද?
(1) ආහාර (2) සන්නිවේදනය (3) නිවාස (4) අධ්‍යාපනය

**2.** 'මිහිරි රසහල' අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
(1) කේවල ස්වාමි ව්‍යාපාර (2) සමිති සංවිධාන
(3) සමුපකාර සමිති (4) රජයේ දෙපාර්තමේන්තු

**3.** ඉහත සිද්ධියට අනුව කමලාගේ හා විමලාගේ
(1) අවශ්‍යතා සමාන ය. (2) වුවමනා සමාන ය.
(3) අවශ්‍යතා විවිධ ය. (4) වුවමනා සීමිත ය.

**4.** 'මිහිරි රසහල' භාවිත කරන පලතුරු අයත් වන නිෂ්පාදන සාධකය කුමක් ද?
(1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය (4) ව්‍යවසායකත්වය

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **5** සිට **7** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කොහු කෙඳි ආශ්‍රිත නිෂ්පාදන අපනයනය කරන 'ලක්සිරි නිපැයුම්' ව්‍යාපාරයේ අයිතිකරුවන් වන නිපුණට හා උපුලිට 2019 වර්ෂයේ හොඳම ව්‍යවසායකයාට හිමි සම්මානය හිමි වූ අතර, රජය විසින් ඔවුන්ට සහ එක් සේවකයකුට විදේශ සංචාරයක් ලබා දෙන ලදී.

**5.** 'ලක්සිරි නිපැයුම්' ව්‍යාපාරයේ බාහිර පරිසර සාධකයක් වන්නේ කුමක් ද?
(1) නිපුණ (2) උපුලි (3) සේවකයා (4) රජය

**6.** 'ලක්සිරි නිපැයුම්' ව්‍යාපාරයට 2019 වර්ෂයේ හොඳම ව්‍යවසායකයාට හිමි සම්මානය හිමි වීම, එම ව්‍යාපාරයට,
(1) ශක්තියකි. (2) දුර්වලතාවයකි. (3) අවස්ථාවකි. (4) තර්ජනයකි.

[දෙවැනි පිටුව බලන්න.

7. 'ලක්සිරි නිපැයුම්' ව්‍යාපාරයට සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   (1) 'ලක්සිරි නිපැයුම්' ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත.
   (2) 'ලක්සිරි නිපැයුම්' ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.
   (3) 'ලක්සිරි නිපැයුම්' ව්‍යාපාරය සම්බන්ධව නිපුණ හා උපුලීගේ වගකීම අසීමිත වේ.
   (4) 'ලක්සිරි නිපැයුම්' ව්‍යාපාරයේ කොහු කෙඳි සඳහා වන පිරිවැය එම ව්‍යාපාරයට වක්‍ර පිරිවැයකි.

8. කුමන හෝ බැංකු ගිණුමක් පවත්වා නොගන්නා රසික තම මෝටර් රථයේ ඉන්ධන බිල විද්‍යුත් කාඩ්පතකින් ගෙවන ලදී. ඔහු භාවිත කළ විද්‍යුත් කාඩ්පත,
   (1) හර කාඩ්පතකි.
   (2) ණය කාඩ්පතකි.
   (3) SET කාඩ්පතකි.
   (4) PET කාඩ්පතකි.

9. මහජන බැංකුවේ ජංගම ගිණුමක් හිමි රංග විසින් කපිලට රු. 8 000 ක මුදල ගෙවීම සඳහා චෙක්පතක් නිකුත් කරන ලදී.
   මෙහි, ..........①.......... රංග ද ..........②.......... කපිල ද වන අතර, ..........③.......... මහජන බැංකුව වේ.
   ඉහත ප්‍රකාශයේ ①, ② හා ③ යන ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) අණකරු, අණලද්දා, ආදායකයා
   (2) අණලද්දා, අණකරු, ආදායකයා
   (3) අණකරු, ආදායකයා, අණලද්දා
   (4) ආදායකයා, අණකරු, අණලද්දා

10. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යන වාසනා, තමා සතු වූ රක්ෂණ ඔප්පුවක් ඇපයට තබා නිවස සෑදීමට ණයක් ලබා ගන්නා ලදී. වාසනා ණය මුදල ලබා ගැනීමට භාවිත කළේ,
   (1) ගිනි රක්ෂණ ඔප්පුවකි.
   (2) මාර්ගස්ථ මුදල් රක්ෂණ ඔප්පුවකි.
   (3) ජීවිත රක්ෂණ ඔප්පුවකි.
   (4) මෝටර් රථ රක්ෂණ ඔප්පුවකි.

11. අභ්‍යන්තර, වාචික හා විද්‍යුත් සන්නිවේදන ක්‍රමයක් දැක්වෙන අවස්ථාව තෝරන්න.
   (1) විදුහල්පතිතුමා උදේ රැස්වීම ශබ්ද විකාශන යන්ත්‍රය මගින් ඇමතීම
   (2) නිෂ්පාදන කළමනාකරු දුරකථනයෙන් සැපයුම්කරුවන් අමතා අමුද්‍රව්‍ය ඇණවුම් කිරීම
   (3) පන්තිභාර ගුරුතුමිය විසින් දෙමාපිය රැස්වීමට සහභාගි වන ලෙස දන්වා දෙමව්පියන් වෙත ලිපි යැවීම
   (4) අලෙවි කළමනාකරු නව මිල ගණන් දන්වා තම ගනුදෙනුකරුවන්ට විද්‍යුත් තැපැල් පණිවුඩයක් යැවීම

12. ප්‍රවාහන මූලිකාංගයක් වන මාධ්‍යය සඳහා නිදසුනක් දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
   (1) දකුණු මුහුදුබඩ දුම්රිය මාර්ගය බෙලිඅත්ත දක්වා දීර්ඝ කිරීම
   (2) හම්බන්තොට දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීම
   (3) කොට්ටාව බහුවිධ ප්‍රවාහන සේවා මධ්‍යස්ථානය විවෘත කිරීම
   (4) පොළොන්නරුව දුම්රිය ස්ථානය දක්වා සුඛෝපභෝගී අධිවේගී දුම්රියක් යෙදවීම

13. සිල්ලර වෙළෙඳාමක් දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
   (1) ආපනශාලාවකට කේක් 2kg ක් මිල දී ගැනීම
   (2) බතික් නිෂ්පාදකයෝ විසින් ලක්සලට බිත්ති සැරසිල්ලක් විකිණීම
   (3) එක්සත් ක්‍රීඩා සමාජයේ වාර්ෂික දන්සැල සඳහා සහල් 200kg ක් විකිණීම
   (4) මොරටු ලී බඩු වෙළෙන්දෝ විසින් අල්මාරියක් ලී බඩු වෙළෙඳ සැලකට විකිණීම

14. විදුහල්පතිතුමා ශිෂ්‍ය නායකයින් පත් කර, ඔවුන්ට පාසලේ අධීක්ෂණ කටයුතු පවරයි. මෙය අයත් වන කළමනාකරණ කාර්යය කුමක් ද?
   (1) සැලසුම්කරණය
   (2) සංවිධානකරණය
   (3) මෙහෙයවීම
   (4) පාලනය

15. රුවන් සතුව පහත ආයෝජන ඇත.
   A - රු. 25 000 ක මහජන බැංකුවේ ස්ථාවර තැන්පතුව
   B - රු. 100 000 ක කොටස් වෙළෙඳපොළ ආයෝජන
   C - රු. 200 000 ක භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන
   ඉහත ආයෝජන, අවදානම වැඩිම ආයෝජනයේ සිට අවදානම අඩුම ආයෝජනය දක්වා පෙළගැස්වූ විට පිළිතුර කුමක් ද?
   (1) B, A, C
   (2) B, C, A
   (3) C, A, B
   (4) C, B, A

[තුන්වැනි පිටුව බලන්න.

EXAMMOOD.LK

**16.** ආයෝජන සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ආයෝජනයක අවදානම වැඩි වන විට එහි ප්‍රතිලාභය අඩු වෙයි.
(2) කොටස් වෙළෙඳපොළ ආයෝජනයෙන් ඉහළ පොලී ආදායමක් ලබා ගත හැකි ය.
(3) ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වාගෙන යාම ආයෝජන මාර්ගයක් ලෙස නොසැලකේ.
(4) අරමුදල් ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ඵලදායි මාර්ගයක යෙදවීම ආයෝජනයයි.

**17.** ව්‍යාපාරයක වත්කම් ගිණුම්වල **පමණක්** සටහන් කෙරෙන ගනුදෙනුව තෝරන්න.
(1) ණයහිමියෙකු වූ දසුන්ට රු. 5 000 ක් ගෙවීම
(2) අයිතිකරු රු. 50 000 ක තම පෞද්ගලික මුදල් ව්‍යාපාරයේ බැංකු ගිණුමේ තැන්පත් කිරීම
(3) රු. 100 000 ක පරිගණකයක් කාර්යාලය සඳහා අත්පිට මුදලට ගැනීම
(4) රු. 12 000 ක බඩු තොගයක් නැවත විකිණීම සඳහා ණයට ගැනීම

**18.** ව්‍යාපාරයක හිමිකමට බලපාන ගනුදෙනුව කුමක් ද?
(1) ණයගැතියකු වූ කුසිතගෙන් රු. 7 500 ක් ලැබීම
(2) ණයහිමියකු වූ විමල්ට රු. 25 000 ක් චෙක්පතකින් ගෙවීම
(3) ව්‍යාපාරයට රු. 50 000 ක බැංකු ණයක් ලබා ගැනීම
(4) පිරිවැය රු. 8 000 ක භාණ්ඩ තොගයක් රු. 9 000 කට ණයට විකිණීම

**19.** ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවක ද්විත්ව සටහන පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| ශාලිකගේ ගිණුම | හර | 5 000 |
| මුදල් ගිණුම | බැර | 4 800 |
| ලද වට්ටම් ගිණුම | බැර | 200 |

මෙම ගනුදෙනුවෙහි රු. 200 ක වට්ටමක් අඩුකර ඇත්තේ,
(1) රු. 5 000 ක බඩු තොගයක් මිල දී ගැනීමේදී ය.
(2) රු. 5 000 ක ණයහිමියකුට මුදල් ගෙවීමේදී ය.
(3) රු. 5 000 ක බඩු තොගයක් අත්පිට විකිණීමේදී ය.
(4) රු. 5 000 ක ණයගැතියෙකුගෙන් මුදල් ලැබීමේදී ය.

**20.** ශිරාන්ගේ ව්‍යාපාරයේ 2019.11.01 දිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි විය.

| වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| 25 000 | = | 15 000 | + | 10 000 |

2019.11.02 දින සිදු කරන ලද ගනුදෙනුවකට පසු එදිනට ගිණුම්කරණ සමීකරණය පහත පරිදි විය.

| වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| 21 000 | = | 14 000 | + | 7 000 |

2019.11.02 දින සිදු වූ ගනුදෙනුව කුමක් ද?
(1) රු. 1 000 ක වට්ටමකට යටත්ව ණයහිමියෙකුට රු. 4 000 ක් ගෙවීම
(2) රු. 1 000 ක වට්ටමකට යටත්ව ණයගැතියෙකුගෙන් රු. 4 000 ක් ලැබීම
(3) රු. 1 000 ක පොළියක් ඇතුළුව රු. 4 000 ක බැංකු ණය වාරිකය ගෙවීම
(4) ණයට ගත් රු. 4 000 ක භාණ්ඩ තොගයක් ශිරාන් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ලබා ගැනීම

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් ප්‍රශ්න අංක **21** හා **22** ට පිළිතුරු සපයන්න.

ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයක් හා මූලාශ්‍ර ලේඛන කිහිපයක් පහත වගුවේ දැක්වේ.

| ගනුදෙනු | මූලාශ්‍ර ලේඛන |
|---|---|
| 1. කපිලට ණයට විකුණුම් රු. 40 000 | A - ලදුපත |
| 2. ණයට ගැනුම් රු. 10 000 | B - ජර්නල් වවුචරය |
| 3. ආයෝජන ආදායම් ලැබීම රු. 5 000 | C - ගැනුම් ඉන්වොයිසිය |
| 4. ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා ලී බඩු ණයට ගැනුම් රු. 50 000 | D - විකුණුම් ඉන්වොයිසිය |

**21.** ඉහත දී ඇති ගනුදෙනු අනුපිළිවෙළ අනුව, මූලාශ්‍ර ලේඛන නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.
(1) B, A, C, D (2) B, C, A, D (3) D, B, A, C (4) D, C, A, B

EXAMMOOD.LK
EXAMMOOD.LK

22. ඉහත ගනුදෙනු සටහන් කිරීමට අදාළ මූලික සටහන් පොත් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) විකුණුම් ජර්නලය, ගැනුම් ජර්නලය, මුදල් පොත, පොදු ජර්නලය
(2) ගැනුම් ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් පොත, පොදු ජර්නලය
(3) ගැනුම් ජර්නලය, විකුණුම් ජර්නලය, පොදු ජර්නලය, මුදල් පොත
(4) විකුණුම් ජර්නලය, ගැනුම් ජර්නලය, පොදු ජර්නලය, මුදල් පොත

23. දීපාල්ගේ ව්‍යාපාරයේ 2019.09.01 දිනට සුළු මුදල් භාරකරු අත ඉතිරි මුදල රු. 250 කි. එදින රු. 4 750 ක අග්‍රිමය ප්‍රතිපූරණය කරන ලදී. 2019 සැප්තැම්බර් මාසයේ සුළු වියදම්වල එකතුව රු. 4 200 කි.
2019.09.30 දිනට අත ඉතිරි මුදල හා 2019.10.01 දින ප්‍රතිපූරණය කළ යුතු මුදල පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) රු. 250, රු. 4 750 (2) රු. 250, රු. 4 200
(3) රු. 800, රු. 4 200 (4) රු. 800, රු. 4 750

24. බැංකු ප්‍රකාශනයේ ශේෂය හා ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය අතර වෙනසට **බලනොපාන** හේතුව කුමක් ද?
(1) තැන්පත් කළ නමුත් බැංකුව, ජංගම ගිණුමට බැර නොකළ චෙක්පත්
(2) බැංකු ගිණුමේ සටහන් නොවූ බැංකුව අය කළ ගාස්තු
(3) විදුලි බිල සඳහා නිකුත් කළ චෙක්පතට බැංකුව විසින් මුදල් ගෙවා තිබීම
(4) ණයගැතියෙකු විසින් සෘජුවම චෙක්පතක් බැංකුවේ තැන්පත් කිරීම

25. අත්කම් නිර්මාණ නිෂ්පාදන ව්‍යාපාරයක විකුණුම් ජර්නලයේ සටහන් කරනු ලබන ගනුදෙනුව තෝරන්න.
(1) අත්කම් නිර්මාණ ණයට විකිණීම රු. 25 000
(2) අත්කම් නිර්මාණ අත්පිට මුදලට විකිණීම රු. 45 000
(3) අත්කම් නිර්මාණ සැකසීමේ යන්ත්‍රය ණයට විකිණීම රු. 65 000
(4) අත්කම් නිර්මාණ සඳහා ණයට ගත් රෙදි තොගයක් අත්පිට මුදලට විකිණීම රු. 55 000

26. සුමුදුගේ ව්‍යාපාරයේ ජනවාරි මාසය සඳහා පිළියෙල කළ විකුණුම් ජර්නලය පහත පරිදි වේ.

**විකුණුම් ජර්නලය**

| දිනය | ඉ.අ. | ගැනුම්කරු | වටිනාකම (රු.) | ලෙ.පි |
|---|---|---|---|---|
| 01/10 | 18 | කුමාරි | 50 000 | |
| Ⓐ | | Ⓑ | 50 000 | |

ඉහත විකුණුම් ජර්නලයේ Ⓐ හා Ⓑ යන ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) 01/10, විකුණුම් ගිණුමට බැර කළා
(2) 01/10, කුමාරිගේ ගිණුමට බැර කළා
(3) 01/31, කුමාරිගේ ගිණුමට බැර කළා
(4) 01/31, විකුණුම් ගිණුමට බැර කළා

27. ව්‍යාපාරයක් සකස් කළ ශේෂ පිරික්සුම එක් ගිණුම්කරණ වරදක බලපෑම හේතුවෙන් සම නොවූ බැවින් එහි වෙනස වූ රු. 2 000 අවිනිශ්චිත ගිණුමේ බැරට සටහන් කර තිබුණි.
එම ගිණුම්කරණ වරද කුමක් ද?
(1) රු. 2 000 ක වැටුප් ගෙවීම, වැටුප් ගිණුමේ සටහන් නොවීම
(2) රු. 2 000 ක ගෙවූ විදුලි බිල, විදුලි ගිණුමේ රු. 1 000 ක් ලෙස සටහන් වීම
(3) රු. 4 000 ක් ණයහිමියන්ට ගෙවීම, ගිණුම්වල සටහන් නොවීම
(4) රු. 4 000 ක ලී බඩු ගැනුම්, ලී බඩු ගිණුමේ රු. 6 000 ක් ලෙස සටහන් වීම

28. ණයහිමියෙකුට ගෙවූ රු. 20 000 ක චෙක්පත අගරු විය. මේ නිසා ව්‍යාපාරයේ,
(1) බැංකු ශේෂය වැඩි වන අතර ණයහිමි ශේෂය ද වැඩි වේ.
(2) බැංකු ශේෂය වැඩි වී ණයහිමි ශේෂය අඩු වේ.
(3) බැංකු ශේෂය අඩු වී ණයහිමි ශේෂය වැඩි වේ.
(4) බැංකු ශේෂය අඩු වන අතර ණයහිමි ශේෂය ද අඩු වේ.



EXAMMOOD.LK EXAMMOOD.LK

**29.** චලිත 2019.10.31 දින රු. 20 000 ක් වටිනා යන්ත්‍රයක් ණයට ගෙන, රු. 8 000 ක බඩු තොග අත්පිට විකුණා, සුළු මුදල් භාරකරුට රු. 3 100 ක් ප්‍රතිපූරණය කළේ ය.
ඉහත ගනුදෙනුවල දී භාවිත කළ මූලාශ්‍ර ලේඛන පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ජර්නල් වවුචරය, ලදුපත, සුළු මුදල් වවුචරය
(2) ජර්නල් වවුචරය, ලදුපත, ගෙවීම් වවුචරය
(3) ගෙවීම් වවුචරය, ලදුපත, සුළු මුදල් වවුචරය
(4) ජර්නල් වවුචරය, ගෙවීම් වවුචරය, සුළු මුදල් වවුචරය

**30.** ලක්තරු ක්‍රීඩා සමාජයේ සාමාජික මුදල් පිළිබඳ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.
- එක් සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 500 කි.
- 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබුණු මුළු සාමාජික මුදල රු. 50 000 ක් විය.
- සාමාජිකයින් හතරදෙනකු පමණක් 2018 වර්ෂය වෙනුවෙන් සාමාජික මුදල් ගෙවා නොතිබුණි.

ලක්තරු ක්‍රීඩා සමාජයේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරනු ලබන ආදායම් ප්‍රකාශයේ දැක්වෙන සාමාජික මුදල,
(1) රු. 2 000 කි. (2) රු. 48 000 කි. (3) රු. 50 000 කි. (4) රු. 52 000 කි.

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **31** හා **32** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තුසිත පොල් ටොෆි සකස් කර විකුණන ව්‍යාපාරයක් කුලියට ගත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යයි. ඔහු දිනකට පොල් ටොෆි 1000 ක් සාදන අතර, ඒ සඳහා යන වියදම් පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| පොල්, සීනි හා අනෙකුත් ද්‍රව්‍ය ............................ | 7 000 |
| ටොෆි සාදන්නාගේ දිනක වැටුප ............................ | 2 500 |
| ගොඩනැගිලි කුලිය දිනකට ............................ | 300 |
| ගෑස් හා විදුලිය වියදම දිනකට ............................ | 200 |

**31.** ටොෆි සාදන්නාගේ වැටුප මෙම ව්‍යාපාරයේ,
(1) වක්‍ර ශ්‍රම පිරිවැයකි. (2) වෙනත් සෘජු පිරිවැයකි.
(3) ප්‍රාථමික පිරිවැයකි. (4) නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයකි.

**32.** පොල් ටොෆි එකක් රු. 12 කට විකුණයි නම් තුසිත පිරිවැය මත තබාගෙන ඇති ලාභාන්තිකය,
(1) 2% කි. (2) 5% කි. (3) 10% කි. (4) 20% කි.

- පහත සඳහන් තොරතුරු භාවිතයෙන් අංක **33** සිට **40** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - 2018.01.01 දින ආරම්භ කළ තරිඳුගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ආදායම් ප්‍රකාශයේ තොරතුරු පහත දැක්වේ.

| **ආදායම්** | **(රු.)** | **වියදම්** | **(රු.)** |
|---|---|---|---|
| ලද වට්ටම් | 1 200 | විකුණුම් කොමිස් | 800 |
| විකුණුම් | 160 000 | ගෙවල් කුලී | 12 000 |
| | | විදුලි ගාස්තු | 8 500 |
| | | බැංකු ණය පොලී | 1 500 |
| | | බෙදාහැරීමේ රථ ක්ෂය | 6 000 |
| | | සේවක වේතන | 18 000 |

  - වර්ෂය තුළ දී ගැනුම් රු. 100 000 කි.
  - තරිඳුගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනට පිළියෙල කළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ තිබූ මුළු වත්කම් හා මුළු වගකීම් පහත දැක්වේ.

| **වත්කම්** | **(රු.)** | **වගකීම්** | **(රු.)** |
|---|---|---|---|
| තොගය | 30 000 | ණයහිමියෝ | 40 000 |
| බෙදාහැරීමේ රථය (පිරිවැයට) | 120 000 | බැංකු ණය | 50 000 |
| ණයගැතියෝ | 35 000 | උපචිත විදුලි ගාස්තු | 1 500 |
| මුදල් ශේෂය | 14 500 | | |

[හයවැනි පිටුව බලන්න.

**33.** තරිඳුගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය,
(1) රු. 60 000 කි. (2) රු. 70 000 කි. (3) රු. 90 000 කි. (4) රු. 160 000 කි.

**34.** තරිඳුගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ආදායම් ප්‍රකාශයේ දැක්වෙන බෙදාහැරීමේ වියදමක් හා මූල්‍ය වියදමක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) විකුණුම් කොමිස්, ගෙවල් කුලී
(2) බැංකු ණය පොලී, විකුණුම් කොමිස්
(3) විකුණුම් කොමිස්, බැංකු ණය පොලී
(4) බැංකු ණය පොලී, බෙදාහැරීමේ රථ ක්ෂය

**35.** තරිඳුගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ආදායම් ප්‍රකාශයේ දැක්වෙන ආයතන හා පරිපාලන වියදම්වල එකතුව,
(1) රු. 20 500 කි. (2) රු. 37 000 කි. (3) රු. 38 500 කි. (4) රු. 40 000 කි.

**36.** තරිඳුගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී ගෙවා ඇති විදුලි ගාස්තුව,
(1) රු. 1 500 කි. (2) රු. 7 000 කි. (3) රු. 8 500 කි. (4) රු. 10 000 කි.

**37.** තරිඳුගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයේ ශුද්ධ ලාභය,
(1) රු. 42 900 කි. (2) රු. 44 400 කි. (3) රු. 45 900 කි. (4) රු. 46 800 කි.

**38.** තරිඳුගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනට ජංගම වත්කම් හා ජංගම වගකීම්වල වටිනාකම පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) රු. 41 500, රු. 79 500
(2) රු. 79 500, රු. 41 500
(3) රු. 79 500, රු. 91 500
(4) රු. 199 500, රු. 91 500

**39.** තරිඳුගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනට බෙදාහැරීමේ රථයේ ධාරණ අගය,
(1) රු. 6 000 කි. (2) රු. 114 000 කි. (3) රු. 120 000 කි. (4) රු. 126 000 කි.

**40.** තරිඳුගේ ව්‍යාපාරයේ 2018.12.31 දිනට හිමිකම,
(1) රු. 102 000 කි. (2) රු. 108 000 කි. (3) රු. 193 500 කි. (4) රු. 199 500 කි.

* *

EXAMMOOD.LK EXAMMOOD.LK

90965



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**60 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2019**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II**
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
Business and Accounting Studies I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**වැදගත් :** උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවලදී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව **I** කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, **II** කොටසෙන් ප්‍රශ්න **දෙකක්** ද, බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

**1.** පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මිහිරිතැන්න මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ මහා සභා රැස්වීමේදී විදුහල්පති ප්‍රකාශ කළේ රත්ගම මාර්ගයේ බස් රථයක් නොමැති බැවින් එම ප්‍රදේශයේ සිට පැමිණෙන සිසුන් ප්‍රමාද වී පාසලට පැමිණෙන බවයි. මෙයට විසඳුමක් ලෙස මෙම විද්‍යාලයේ ආදි ශිෂ්‍යයින් තිදෙනෙකු වන අමිල, රුවන් සහ නයනා එකතු වී රු. 200 000 ක් බැගින් සහ වාර්ෂික පොලී අනුපාතය 6% වූ රු. 400 000 ක බැංකු ණය මුදලක් ද යොදවා, පාවිච්චි කළ කුඩා බස් රථයක් මිල දී ගෙන 'අරුණ ටුවර්ස්' නමින් ව්‍යාපාරයක් 2019 ඔක්තෝබර් මස 01 දින ආරම්භ කරන ලදී. මෙම බස් රථය රත්ගම මාර්ගයේ ධාවනය මෙන් ම චාරිකා සඳහා ද යොදවනු ලැබේ.

2019.10.31 දිනෙන් අවසන් මාසය තුළ සිදු වූ ගනුදෙනුවල සාරාංශයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ● බස් රථයෙන් ලැබීම් | |
| මගීන්ගෙන් | 96 000 |
| චාරිකාවලින් | 45 000 |
| ● ගෙවූ වියදම් | |
| ඉන්ධන වියදම් | 38 000 |
| බස් රථය අලුත්වැඩියා වියදම් | 9 000 |
| රියදුරු වැටුප් | 35 000 |
| වෙනත් වියදම් | 7 000 |

2019.10.31 දිනට පහත තොරතුරු සපයා ඇත.

* බස් රථය වාර්ෂිකව 12% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කෙරේ.
* ලැබිය යුතු චාරිකා ආදායම් රු. 15 000 කි.
* රු. 12 000 ක් වූ වාර්ෂික රක්ෂණ ගාස්තුව හා සහායකගේ මාසික වැටුප වන රු. 15 000 ගෙවා නොමැත.

2019.10.31 දින අයිතිකරුවන් තිදෙනා නව බස් රථයක් ව්‍යාපාරයට මිල දී ගැනීමට තීරණය කළ අතර, ඒ සම්බන්ධව තොරතුරු අන්තර්ජාලය භාවිතයෙන් සොයා බලන ලදී. එදිනම ව්‍යාපාරයට සේවකයකු ද බඳවා ගන්නා ලදී.

(i) (අ) 'අරුණ ටුවර්ස්' ව්‍යාපාරය මගින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව සඳහන් කර, 'අරුණ ටුවර්ස්' මගින් එම අවශ්‍යතාව සපුරාලන ආකාරය දක්වන්න.

(ආ) මිහිරිතැන්න මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය, හිමිකාරිත්වය අනුව අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ii) 'අරුණ ටුවර්ස්' ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අවශ්‍ය බව නයනා පවසයි.

(අ) ඔබ නයනාගේ ප්‍රකාශය හා එකඟ වන්නේ ද?

(ආ) ඉහත (ii) (අ) හි ඔබ සඳහන් කළ පිළිතුරට හේතුවක් දක්වන්න.

[අටවැනි පිටුව බලන්න.

EXAMMOOD.LK EXAMMOOD.LK

(iii) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධක **දෙකක්** නම් කර, ඒවා සඳහා නිදසුන් සිද්ධියේ සඳහන් 'අරුණ ටූවර්ස්' ව්‍යාපාරය ඇසුරෙන් ලියන්න. (පිළිතුරු සැපයීමට පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න.)

| අභ්‍යන්තර පරිසර සාධක | නිදසුන |
|---|---|
| 1. | |
| 2. | |

(iv) (අ) මෙම සිද්ධියේ සඳහන් සන්නිවේදන මාධ්‍යයක් හා ඊට අදාළ සන්නිවේදන ක්‍රමයක් ලියන්න.

(ආ) මෙම සිද්ධියේ සඳහන් වන කළමනාකරණ ක්‍රියාවලියේ සැලසුම්කරණයට අයත් කාර්යයක් ලියන්න.

(v) 2019.10.01 දිනට 'අරුණ ටූවර්ස්' ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිතව ලියන්න.

(vi) (අ) 'අරුණ ටූවර්ස්' ව්‍යාපාරයේ රියදුරුට වැටුප් ගෙවීමට අදාළ ද්විත්ව සටහන ලියන්න.

(ආ) 'අරුණ ටූවර්ස්' ව්‍යාපාරයේ 2019.10.31 දිනෙන් අවසන් මාසය සඳහා පිළියෙල කරන ආදායම් ප්‍රකාශයේ දැක්විය යුතු මුළු වැටුප් වටිනාකම කොපමණ ද?

(vii) 'අරුණ ටූවර්ස්' ව්‍යාපාරයේ ගනුදෙනු සටහන් කිරීම සඳහා භාවිත කෙරෙන මූලික සටහන් පොත් **දෙකක්** හා මූලාශ්‍ර ලේඛන **දෙකක්** ලියන්න.

(viii) 2019.10.31 දිනට 'අරුණ ටූවර්ස්' ව්‍යාපාරයේ මුදල් ශේෂය ගණනය කරන්න.

(ix) 2019.10.31 දිනෙන් අවසන් මාසයේ 'අරුණ ටූවර්ස්' ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය ගණනය කරන්න.

(x) 2019.10.31 දිනට 'අරුණ ටූවර්ස්' ව්‍යාපාරයේ මුළු හිමිකම හා මුළු වගකීම් කොපමණ ද?

(ලකුණු 02 × 10 = 20 යි)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

**2.** (i) (අ) මිනිස් වුවමනාවක් යනු කුමක් ද?

(ආ) මිනිස් වුවමනාවක ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරිකයින්ට මිනිස් අවශ්‍යතා නිර්මාණය කළ හැකි අතර, මිනිස් වුවමනා නිර්මාණය කළ නොහැකි ය.

(ආ) නිෂ්පාදන ව්‍යාපාරයක සැපයුම්කරුවෝ එම ව්‍යාපාරයේ අභ්‍යන්තර පරිසර සාධකයකි.

(ඉ) සංස්ථාපිත සමාගමක සාමාන්‍ය කොටස් මිල දී ගත් ඕනෑම පුද්ගලයෙක් හෝ ආයතනයක් එම සමාගමේ අයිතිකරුවකු වේ.

(ඊ) ව්‍යාපාර සෑම විට ම ලාභ අරමුණු කරගෙන කටයුතු කරයි. (ලකුණු 02 යි)

(iii) කොග්ගල පදිංචි සුමනා, කාන්තිගේ සහාය ද ඇතිව තම ඉඩමක කුරුඳු වගා කර 'හෙළ කුරුඳු තේ' නිෂ්පාදනය කර, මඩොල් දූව නැරඹීමට පැමිණෙන සංචාරකයින්ට, නගරයේ වෙළෙඳසැල්වලට හා දේශීය පාරිභෝගිකයින්ට අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

(අ) 'හෙළ කුරුඳු තේ' ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්ව වන සේවකයන් සහ ගනුදෙනුකරුවන් සඳහා සිද්ධියේ ඇතුළත් නිදසුන බැගින් ලියන්න.

(ආ) ඉහත (iii) (අ) සඳහා ඔබ සඳහන් කළ එක් එක් ඇල්මැති පාර්ශ්වය, 'හෙළ කුරුඳු තේ' ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතුව බැගින් ලියන්න. (ලකුණු 02 යි)

(iv) පහත දැක්වෙන්නේ ව්‍යාපාර නාම කිහිපයකි.

1. ශක්ති බතික් නිෂ්පාදකයෝ
2. සකුරා බිම්මල්
3. සුවය ආරෝග්‍ය ශාලාව
4. සාගර රියදුරු පාසල

(අ) ඉහත එක් එක් ව්‍යාපාරය විසින් සපුරාලනු ලබන මිනිස් අවශ්‍යතාව ලියන්න.

(ආ) ඉහත එක් එක් ව්‍යාපාරය නිෂ්පාදිතයේ ස්වභාවය අනුව අයත් වන ව්‍යාපාර වර්ගය සඳහන් කරන්න.

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**



EXAMMOOD.LK

**3.** (i) (අ) වාණිජ බැංකුවක් යනු කුමක් ද?

(ආ) සන්නිවේදන ක්‍රමයක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ඉතිරි කිරීමේ තැන්පතුවලට සාපේක්ෂව ස්ථාවර තැන්පතු සඳහා ඉහළ ප්‍රතිලාභයක් හිමි වේ.

(ආ) උපරිම විශ්වාසය නැමැති රක්ෂණ මූලධර්මය අදාළ වන්නේ දේපළ රක්ෂණය සඳහා පමණි.

(ඉ) සන්නිවේදනය යනු බාහිර පුද්ගලයින් සහ ආයතන අතර පමණක් තොරතුරු හුවමාරු කර ගැනීමයි.

(ඊ) කිසියම් රටක් විදේශ රටකට හෝ රටවලට දේශීය නිෂ්පාදිත විකිණීම අපනයන වෙළෙඳාම ලෙස හැඳින්වේ.

(ලකුණු 02 යි)

(iii) ලංකා බැංකුවේ ජංගම ගිණුමක් පවත්වා ගෙන යන ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් විශේෂ රේඛනයක් සහිත රු. 200 000 ක චෙක්පතක් මහජන බැංකුවේ ජංගම ගිණුමක් හිමි ශ්‍රී ලංකා ටෙලිකොම් පී. එල්. සී. වෙත නිකුත් කරන ලදී.

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ශ්‍රී ලංකා ටෙලිකොම් පී. එල්. සී. මගින් සපයන උපකාරක සේවාව වෙන වෙන ම ලියන්න.

(ආ) ඉහත සිද්ධියට අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය නිකුත් කළ චෙක්පත රේඛනය කර තිබූ ආකාරය දක්වන්න. (ලකුණු 02 යි)

(iv) විපුල තම පියාට අයත් මෝටර් රථය පදවාගෙන යන අතරතුර, අනතුරකට භාජනය විය. ඒ බව විපුල තම දුරකථනයෙන් රක්ෂණ සමාගමට දැනුම් දුන්නේ ය. රක්ෂණ නියෝජිතයා පැමිණ ඇස්තමේන්තු කළ හානියට අදාළ වන්දිය විපුල ඉල්ලා සිටිය ද, ඔහුට එය ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී.

(අ) රක්ෂණ වන්දිය විපුලට දීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ රක්ෂණ මූලධර්මය කුමක් ද?

(ආ) ඉහත සිද්ධියේ ඇතුළත් විද්‍යුත් සන්නිවේදන ක්‍රියාවලිය හඳුනාගෙන, එහි යවන්නා, පණිවුඩය, මාධ්‍යය, ලබන්නා, ප්‍රතිචාරය හා ප්‍රතිපෝෂණය සඳහා නිදසුන් ලියන්න.

(ලකුණු 02 යි)
**(මුළු ලකුණු 08 යි)**

**4.** (i) (අ) 'අලෙවිකරණය' යනු කුමක් ද?

(ආ) අලෙවිකරණ මිශ්‍රයේ නිෂ්පාදිතය යන විචල්‍යයට ඇතුළත් වන අයිතම **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) අසීමිත සම්පත් කාර්යක්ෂමව යොදා ගනිමින් ව්‍යාපාර අරමුණු සාක්ෂාත් කරගැනීමේ ක්‍රියාවලිය කළමනාකරණය වේ.

(ආ) ව්‍යාපාරයක අලෙවිකරණ පරමාර්ථ ඉටුකර ගැනීමේදී අලෙවිකරණ මිශ්‍රයේ වැදගත් ම විචල්‍ය වන්නේ ස්ථානයයි.

(ඉ) ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ පවතින නියාමන ආයතනයකි.

(ඊ) රජයේ දිගුකාලීන මූල්‍ය අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරයි.

(ලකුණු 02 යි)

(iii) ව්‍යාපාරයක අලෙවි කළමනාකරුවකු නිෂ්පාදිතයක් හඳුන්වා දෙමින් කළ ප්‍රකාශයක් පහත දැක්වේ.
"උණුසුම රඳවා ගත හැකි, නිල් පැහැති, නව කෑම ඇසුරුමෙහි පිරිවැය රු. 100 කි. පිරිවැයට 10% ක ලාභාන්තිකයක් සහිතව මිල නියම කිරීමටත්, අලෙවි ප්‍රවර්ධකයින් මගින් නගරයේ පාසල් අසල මූලික හඳුන්වාදීම සිදු කිරීමටත් තීරණය කර ඇත."

(අ) ඉහත ප්‍රකාශයේ ඇතුළත් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍ය වන නිෂ්පාදිතය, මිල, ස්ථානය හා ප්‍රවර්ධනය සඳහා නිදසුන බැගින් ලියන්න.

(ආ) ඉහත ප්‍රකාශයේ ඇතුළත් සැලසුම්කරණයට අදාළ කාර්යයක් සඳහා නිදසුනක් ලියන්න.

(ලකුණු 02 යි)



EXAMMOOD.LK
EXAMMOOD.LK

(iv) සාමාට රු. 100 000 ක ඉතිරි කිරීම් තැන්පතුවක් ද, අමරට රු. 80 000 ක ස්ථාවර තැන්පතුවක් ද, රුවන්ට රු. 50 000 ක කොටස් වෙළෙඳපොළ ආයෝජනයක් ද ඇත.

(අ) ඉහත ප්‍රකාශයේ ඇතුළත් තිදෙනාගෙන් වැඩි ම අවදානමක් සහිත ආයෝජනය සිදු කර ඇත්තේ කවුද?

(ආ) "සාමාගේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය, රුවන්ගේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතයට වඩා වැඩි විය යුතු ය." ඔබ මෙම ප්‍රකාශය සමග එකඟවන්නේ ද? පිළිතුරට හේතුවක් ලියන්න.

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

## II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

**5.** (i) (අ) ව්‍යාපාරයක හිමිකම යනු කුමක් ද?

(ආ) කේවල ස්වාමි ව්‍යාපාරයක හිමිකම වෙනස්වන අවස්ථා **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.

(අ) ණයගැති මාධවගෙන් රු. 7 000 ක චෙක්පතක් ලැබීම

(ආ) ගෘහ භාණ්ඩ වෙළෙඳසැලක් හිමි නදුන් තම ව්‍යාපාරයෙන් රු. 35 000 ක් වූ කෑම මේසයක් තම පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ගෙනයාම (ලකුණු 02 යි)

(iii) සහන්ගේ ව්‍යාපාරයේ ගනුදෙනු හතරක් ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණයට බලපෑ ආකාරය පහත දැක්වේ.

| දිනය | ගනුදෙනුව | වත්කම් (රු.) = | හිමිකම් (රු.) + | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| 2019.10.02 | 1 | බඩු තොගය + 15 000 | | ණයහිමියෝ + 15 000 |
| 2019.10.03 | 2 | ලී බඩු + 25 000<br>මුදල් − 25 000 | | |
| 2019.10.04 | 3 | බඩු තොගය − 10 000<br>ණයගැතියෝ + 12 000 | ලාභය + 2 000 | |
| 2019.10.05 | 4 | මුදල් − 9 000 | ලද වට්ටම + 1 000 | ණයහිමියෝ − 10 000 |

තව ද සහන්ගේ ව්‍යාපාරයේ 2019.10.01 දිනට මුළු වත්කම් රු. 250 000 ක් වූ අතර, මුළු වගකීම් රු. 50 000 ක් විය.

**අවශ්‍ය වන්නේ:**

(අ) මෙහි සඳහන් 1, 2, 3, 4 ගනුදෙනු, වටිනාකම් සහිතව ලිවීම

(ආ) ඉහත ගනුදෙනු සටහන් කිරීමෙන් පසු 2019.10.05 දිනට ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිතව දැක්වීම (ලකුණු 04 යි)

(iv) රුවන් ට්‍රේඩර්ස්හි නොවැම්බර් මාසය සඳහා ලැබුණු සුළු මුදල් අග්‍රිමය රු. 1000 කි. 2019 නොවැම්බර් මාසයේ සුළු මුදල් ගෙවීම් පහත දැක්වේ.

| දිනය | ව.අ. | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 2019.11.02 | 01 | තැපැල් ගාස්තු | 150 |
| 2019.11.10 | 02 | ගමන් වියදම් | 80 |
| 2019.11.15 | 03 | සංග්‍රහ වියදම් | 200 |
| 2019.11.29 | 04 | ත්‍රිරෝද රථ ගාස්තු | 200 |

**අවශ්‍ය වන්නේ:**

ඉහත ගනුදෙනු සුළු මුදල් පොතක සටහන් කිරීම හා 2019.11.30 දිනට සුළු මුදල් පොත තුලනය කර දැක්වීම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

EXAMMOOD.LK

[එකොළොස්වැනි පිටුව බලන්න.

6. (i) (අ) 'ශේෂ පිරික්සුම' යනු කුමක් ද?

(ආ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් වන ගිණුම්කරණ මූලිකාංග **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) සිතුම්ගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් හා අලුතින් බඳවාගත් ගිණුම් ලිපිකරු විසින් ඒවා ගිණුම්ගත කර ඇති ආකාරය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 2019.03.01 | අතිරේක ප්‍රාග්ධනය යෙදවීම | රු. 50 000 |
| 2019.03.02 | ණයට ගැනුම් | රු. 45 000 |
| 2019.03.03 | විදුලි බිල ගෙවීම | රු. 8 000 |
| 2019.03.04 | ලී බඩු මිල දී ගැනීම | රු. 12 000 |
| 2019.03.05 | අත්පිට විකුණුම් | රු. 30 000 |

**ලෙජර් ගිණුම්:**

**මුදල් ගිණුම**

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස.පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 03.01 | ප්‍රාග්ධන ගිණුම | | 50 000 | 03.03 | විදුලි බිල් ගිණුම | | 8 000 |
| 03.05 | විකුණුම් ගිණුම | | 30 000 | 03.04 | ලී බඩු ගිණුම | | 12 000 |

**ප්‍රාග්ධන ගිණුම**

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස.පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| | | | | 03.01 | මුදල් ගිණුම | | 50 000 |

**ගැනුම් ගිණුම**

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස.පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| 03.04 | මුදල් ගිණුම | | 12 000 | | | | |

**විදුලි බිල් ගිණුම**

| දිනය | විස්තරය | ස.පි | වටිනාකම (රු.) | දිනය | විස්තරය | ස.පි | වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|
| | | | | 03.03 | මුදල් ගිණුම | | 8 000 |

**අවශ්‍ය වන්නේ:**

(අ) ගිණුම් තැබීමේදී සිදු වී ඇති වැරදි මොනවා දැයි වටිනාකම් සහිතව ලියා දැක්වීම

(ආ) ඉහත (ii) (අ) හි සඳහන් කළ වැරදිවලින් ඕනෑම වැරදි **දෙකක්** නිවැරදි කිරීමේ ජර්නල් සටහන් (ලකුණු 04 යි)

(iii) නිර්මාල් විසින් පාවිච්චි කළ ප්ලාස්ටික් බෝතල් භාවිත කර මල් බඳුන් නිපදවා අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. 2019 මැයි මාසයට අදාළ තොරතුරු මෙසේ ය.

| | රු. |
|---|---|
| ප්ලාස්ටික් බෝතල් මිල දී ගැනුම් .................................... | 13 000 |
| මල් බඳුන් සකස් කරන්නාගේ වැටුප ................................ | 6 000 |
| මල් බඳුන් තීන්ත ආලේපන වියදම් .................................. | 2 500 |
| විදුලි ගාස්තු ................................................................ | 3 000 |
| මල් බඳුන් සැකසීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම .................... | 60 000 |

අතිරේක තොරතුරු:
- යන්ත්‍රය සරල මාර්ග ක්‍රමයට වාර්ෂික ව 10% බැගින් ක්ෂය කළ යුතුයි.
- සියලු ද්‍රව්‍ය භාවිත කර මැයි මාසය තුළ මල් බඳුන් 100 ක් නිපදවා ඇත.

**අවශ්‍ය වන්නේ:**

2019.05.31 දිනෙන් අවසන් මාසයේ නිෂ්පාදන පිරිවැය ලේඛනය පිළියෙල කිරීම (ලකුණු 02 යි)

(iv) සැම්ගේ ව්‍යාපාරයේ 2019.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ලද බැංකු ප්‍රකාශනයෙන් උපුටාගත් තොරතුරු පහත දැක්වේ.

2019 03.01 දිනට බැර ශේෂය රු. 11 000

**තැන්පත් කිරීම්:**

| | | |
|---|---|---|
| 03/02 | මුදල් | රු. 20 000 |
| 03/05 | චෙක්පත් (758011) | රු. 22 000 |
| 03/15 | සෘජු ප්‍රේෂණ | රු. 15 000 |

**අඩු කිරීම්:**

| | | |
|---|---|---|
| 03/04 | වැටුප්-චෙක්පත් අංක 352301 | රු. 10 000 |
| 03/25 | තුසිත-චෙක්පත් අංක 352302 | රු. 20 000 |
| 03/30 | බැංකු ගාස්තු | රු. 3 000 |

**අවශ්‍ය වන්නේ:**

(අ) 2019 මාර්තු මාසය සඳහා බැංකු ප්‍රකාශනය පිළියෙල කිරීම

(ආ) ඉහත තොරතුරුවලින් ව්‍යාපාරයේ බැංකු ගිණුම සංශෝධනය සඳහා යොදා ගන්නා අයිතමයක් නම් කිරීම (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

7. (i) (අ) බොල් ණය යනු කුමක් ද?

(ආ) ලාභ අරමුණු කර නොගත් සංවිධාන සඳහා ආදායම් ප්‍රකාශනයක් පිළියෙල කිරීමේ අරමුණ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) පුබුදු යෞවන සමාජයේ සාමාජික සංඛ්‍යාව 100 කි. එක් සාමාජිකයකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 50 කි. 2019 ඔක්තෝබර් මාසයට අදාළව ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ලිපිද්‍රව්‍ය මිල දී ගැනීම .................................. | 3 000 |
| පුවත්පත් හා සඟරා මිල දී ගැනීම ................ | 6 000 |
| තැපැල් වියදම් ............................................ | 500 |
| පරිත්‍යාග ලැබීම් .......................................... | 3 000 |

අතිරේක තොරතුරු:
- සාමාජිකයින් 20 දෙනෙකු ඔක්තෝබර් මාසය සඳහා සාමාජික මුදල් ගෙවා නැත
- 2019.10.01 දිනට ලැබීම් හා ගෙවීම් ගිණුමේ ශේෂය රු. 5 000 ක් විය.

**අවශ්‍ය වන්නේ:**

පුබුදු යෞවන සමාජයේ 2019.10.31 දිනෙන් අවසන් මාසය සඳහා ලැබීම් හා ගෙවීම් ගිණුම පිළියෙල කිරීම (ලකුණු 02 යි)



EXAMMOOD.LK EXAMMOOD.LK

(iii) සංඛගේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2018.12.31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු.) | බැර (රු.) |
|---|---|---|
| ගොඩනැගිලි (පිරිවැයට) | 350 000 | |
| ගොඩනැගිලි ක්ෂය වෙන්කිරීම් (2018.01.01 දිනට) | | 140 000 |
| තොගය (2018.01.01 දිනට) | 30 000 | |
| ගැනුම් | 220 000 | |
| විකුණුම් | | 300 000 |
| ණයගැතියෝ | 40 000 | |
| ණයහිමියෝ | | 30 000 |
| දුන් වට්ටම් | 2 500 | |
| ලද වට්ටම් | | 2 000 |
| විදුලි ගාස්තු | 5 000 | |
| බොල් ණය | 1 500 | |
| 12% බැංකු ණය | | 100 000 |
| බැංකු ණය පොලී | 10 000 | |
| මුදල් ශේෂය | 35 000 | |
| දුරකථන ගාස්තු | 2 000 | |
| ප්‍රාග්ධනය | | 124 000 |
| | 696 000 | 696 000 |

අතිරේක තොරතුරු:

- 2018.12.31 දිනට තොගය රු. 22 000 කි.
- ගොඩනැගිලි සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 20% බැගින් ක්ෂය කළ යුතු ය.
- 2018.12.31 දිනට උපචිත විදුලි ගාස්තුව රු. 1000 කි.

**අවශ්‍ය වන්නේ:**

(අ) 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශය (ලකුණු 04 යි)

(ආ) 2018.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

* * *

EXAMMOOD.LK EXAMMOOD.LK